www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# අන්ධකාරය, ව්‍යාකූලත්වය හා බෙදීම්, ලෝක ආර්ථික සංසදය අරක්ගනියි

## Gloom, perplexity, divisions dominate world Economic Forum in Davos

**2009 ජනවාරි 31**

ස්විට්සර්ලන්තයේ ඩේවෝස් හි ඇල්පයින් නිවාඩු නිකේතනයෙහි 28 වන දින ආරම්භවූ වාර්ෂික ලෝක ආර්ථික සංසදයට රාජ්‍ය නායකයන් 41 දෙනෙක් හා කැබිනට් ඇමතිවරු ද ඇතුලු ලෝක දේශපාලන හා ව්‍යාපාරික ප්‍රභූවේ නියෝජිතයෝ 2500 ක් සහභාගී වෙති. මෙවර සංසදය පැවැත්වෙන්නේ ''නිදහස් ව්‍යවසායකත්ව පද්ධතියේ'' අනර්ගත්වය පිලිබඳව පැවති ඉහල විශ්වාසය කීතු කර දමා ඇති ගෝලීය මූල්‍ය දියවීම හා ආර්ථික වැටීම මධ්‍යයේ ය. සමුලුව තුල මතුවන්නේ ගැඹුරු අර්බුයේ හා ලෝක ධනවාදයේ නායකයන් අතර ව්‍යාකූලත්වයේ දසුනකි.

සියලු වාර්තාවලට අනුව එහි පවතින්නේ අඳුරු හා නපුරු පෙරනිමිති පිලිබඳ මනෝභාවයකි. පැමින සිටින සියල්ලන්ම තමන් මුහුනපා සිටින්නේ මහා අවපාතයෙන් පසුව එලඹ ඇති අතිශය බැරෑරුම් ආර්ථික අර්බුදයට බව පොදුවේ පිලිගත්ත ද, කථා හා සාකච්ඡාවලින් පෙනීයන්නේ අර්බුදයේ මූලික හේතු සාධක කිසිවක් පිලිබඳව එකඟත්වයක් හෝ එය විසඳිය යුත්තේ කෙසේ ද යන්න පිලිබඳ ඒකාබද්ධ සංකල්පයක් කිසිවෙකුටත් නොමැති බවයි.

සංසදයට පැමින සිටින ආරාධිත අමුත්තන් පිලිබඳව මාධ්‍ය දෙටුවෙක් වන රූපට් මර්ඩොක් ගේ ප්‍රකාශයක් උපුටා දක්වමින් වොෂින්ටන් පෝස්ට් පත්‍රය මෙසේ පැවසීය. එක්සත් ජනපදයේ ලේමන් බ්‍රදර්ස් ආයෝජන බැංකුව බිඳ වැටීමත් සමඟ අර්බුදය නරක අතට හැරුනු පසුගිය සැප්තැම්බරයේ සිට අතුරුදහන්වූ ''පෞද්ගලික ධනය ඩොලර් ට්‍රිලියන 50 ත් සමඟ ඔවුහු හෙම්බත්ව හා අන්ද මන්ද ව සිටිති.''

ආරක්ෂිත අරමුදල් කලමනාකරුවෙකු වන ප්‍රකෝටිපති ජෝර්ජ් සොරෝස්ගෙන් ද පුවත්පත උපුටා දැක්වීය. ''අද අප මුහුනපා සිටින්නේ 1930 ගනන්වල ගැටලුවට වඩා විශාල දෙයකටය.''

1971 දී ප්‍රථම වතාවට ලෝක ආර්ථික සංසදය දියත් කරනු ලැබුවේ, එහි මූලාරම්භක හා තවමත් එහි සභාපති වන ස්විස්ට්සර්ලන්ත අර්ථශාස්ත්‍රඥ හා ව්‍යාපාරික කාලෝස් සික්වාබ් විසිනි. ඒ, පශ්චාත් යුධ කාලීන ආර්ථික ප්‍රසාරනයට පදනම සැපයූ, එක්සත් ජනපද ඩොලර්-රත්රන් පරිවර්ත්‍යතාව මත පදනම්වූ ජාත්‍යන්තර මූල්‍ය ආකෘතිය, එනම් බ්‍රෙටන්වුඩ්ස් පද්ධතිය එම වසරේ අගෝස්තු මාසයේදී බිඳ වැටීමට තුඩුදෙමින් වර්ධනයවූ මූල්‍ය අර්බුදය මධ්‍යයේ ය. ඉන් පසුව එලඹි වසරවල සංසදය, ජාත්‍යන්තර ආර්ථික හා දේශපාලන ප්‍රශ්න සාකච්ඡා හා විවාද කල ව්‍යාපාර ප්‍රධානීන්ගේ හා ආන්ඩුවල නිලධාරීන්ගේ අර්ධ-නිල එකතුවක් කරා වර්ධනය විය.

සෝවියට් සංගමය බිඳ වැටුනු තැන් පටන් වඩා මෑත වසරවල, චිත්‍රපට නලු නිලියන් හා අනෙකුත් ප්‍රසංගවේදීන් ගේ ශුභාශිංසන මධ්‍යයේ අර්ථ ශාස්ත්‍රඥයන්ගේ ද මාධ්‍යකරුවන්ගේ ද කුඩා හමුදාවක් පිරිවරාගත් ඇමරිකානු ආයෝජන බැංකුකරුවන් පරිශ්‍රය ග්‍රහනයට ගැනීමත් සමඟ, එය ''නිදහස් ව්‍යවසායකත්ව ක්‍රමයේ'' ජයග්‍රහනය හුවා දක්වන ස්ථානයක් බවට පත් විය.

වසරකට පෙර, ජාත්‍යන්තරවම පාහේ අනපේක්ෂිතව සිදුවූ එක්සත් ජනපද නිවාස වෙලඳපොලේ බිඳවැටීම හා නය අර්බුදයේ පැන නැඟීම මඟින් ජනිත කල සිත් සසල කරන වර්ධනයන් පිලිබඳව සංසදයේ කනස්සල්ල පලවන විට, ඇමරිකානු බැංකු කරුවන් හා දේශපාලඥයන් මෙම අවුල ඉක්මනින්ම විසඳෙනු ඇතැයි ද, වාතාවරනයේ නරකම අවස්ථාව වන එක්සත් ජනපදයේ පසුබෑම වුව ද කෙටි හා මන්දගාමී වනු ඇතැයි ද සහතික වෙමින් එය සන්සුන් කරන ලදී. සාකච්ඡාවන් බොහෝ කොටම මාධ්‍යගත වූයේ, එකක් අනෙකෙන් පියවී යාමේ (ාැජදමචකසබට) සංසිද්ධිය හේතුකොටගෙන එක්සත් ජනපද මූල්‍ය වෙලඳපොලවල ගැටලු යුරෝපයට හෝ ආසියාවට පැතිර නොයනු ඇතැයි යන පුලුල් ලෙස පිලිගත් අදහස මතය.

සංසදයේ ප්‍රධාන ව්‍යාපාරික නිලධාරී රොබට් ග්‍රීන්හිල්, මෙසේ ප්‍රකාශ කරමින් සැසියට තානය සැපයීය. ''1970 ගනන් වල බෙදීම් හා අතීරනයේ කාලයක ආරම්භ කල රැස්වීම, මේ වසරේ ඒවායේ මූලයන් කරා යලි පැමිනීමක් සනිටුහන් කරයි. මිනිස්සු බරපතල අර්බුදයකින් නැඟී සිටීමට තමන් කල යුතු වන්නේ කුමක්දැයි සටහන් සැසඳීමෙන් සොයා බලති.''

අර්බුදය කෙතෙක් බරපතල හා සර්ව ගෝලීය දැයි, ප්‍රධාන කොටම එක්සත් ජනපදය, බ්‍රිතාන්‍ය, ප්‍රංශය,

ජර්මනිය හා ජපානයේ ආර්ථික හැකිලීම ද අතුලුව ගත්කල, 2009 ලෝක ආර්ථික වර්ධනය සියයට 0.5 ක් පමනක් වනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රති සංශෝධිත තක්සේරුව මගින් ප්‍රථම දිනයේම සලකුනු කලේය. ඉන් පසුව පැමිනියේ, 2009 වසරේදී ලෝක වෙලඳමේ ධාරිතාවය සියයට 2.8 කින් හැකිලෙනු ඇති බවට පූර්ව සතියෙහි ජාමූඅ කල පුරෝකථනයයි.

මෙම වසරේ සංසදය අරක්ගත් හා අන්තර් සමබන්ධිත අංග දෙක වන්නේ, ඩොලර් ට්‍රිලියන ගනනක්වූ නය, ප්‍රතිඥවන් හා මුදල් පොම්ප කිරීමෙන් බැංකු වලට මුක්කු ගැසීමට හා ආර්ථික ක්‍රියාවලිය පන ගැන්වීමට ආන්ඩු හා මහ බැංකු විසින් දරන ලද ප්‍රයත්නය ඉක්මවා ගිය අර්බුදයේ නිර්ධය හා වේගවත් ස්වභාවය ද, ඇමරිකානු කීර්තිය හා විශ්වාසනීයත්වය කෙරෙහි ඇතිවූ නස්පැත්තිය ද මුල්කොටගෙන හටගත් කම්පනය හා කුලප්පුවයි.

28 වන දින *ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රය මෙසේ ලිවීය. ''වඩාත්ම සැලකිල්ලට භාජනය විය යුත්තේ, බැංකුවල අලාභ කඳු ගැසෙද්දී, භූගෝලීයකරනය, මූල්‍ය නව්‍යකරනය හා නිදහස් වෙලඳපොල තරඟය යන දේවල සම්මිශ්‍රනයෙන් වඩා හොඳ මූල්‍ය පද්ධතියක් ගොඩනැගෙනු ඇති බවට පැවති විශ්වාසය වියැකී යාමයි. එබැවින් මෙම වසරේ ඩේවෝස්හි රැස්වීම මත දැන් ලඹදෙන තීරනාත්මක ප්‍රශ්නය නම් ''මෙම විශ්වාසය ඌනපූරනය කලහැකි යමක් ඇත්නම් ඒ කුමක් ද'' යන්නයි.

ඒ මඟම ගනිමින් 30 වන දින *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රය කේම්බ්‍රිජ් බලශක්ති පරියේෂන සමාගමෙහි මූලාරම්භක ජේම්ස් රොසෙන්ෆීල්ඩ්ගේ ප්‍රකාශයක් උපුටා දැක්වීය. ''අපි සියලු දෙන එක්ව මෙම දැවැන්ත හා ඒකාග්‍රිත මූල්‍ය පද්ධතිය ගොඩනගා ගත්තෙමු. එය බිඳ විසිරයාමේදී කුමක් සිදුවිය හැකිද යන්න කෙරෙහි අප සැලකිල්ල යොමුකර නැත.''

එක්සත් ජනපදයේ තත්වය සම්බන්ධයෙන් ගත් කල, සංසදයේ ආරම්භක දිනය චීන අගමැති වෙන්ජියාබාවෝ හා රුසියානු අගමැති ව්ලැඩිමීර් පුටින් වෙත පවරා තිබුනි. ලෝකය අර්බුදයට ඇද හෙලීම පිලිබඳව ඔවුන් දෙදෙනාම සිය ප්‍රහාරයේ ඉලක්කය කෙලින්ම පෙන්නුම් නොකල නමුත්, එක්සත් ජනපදය වෙත දැඩි ලෙස එල්ල කල අතර ලෝක වෙලඳපොලවල් මත එක්සත් ජනපදයේ අධිකාරය ලිහිල් කිරීමේ පියවර ගැනීම සඳහා කැඳවුම් කලහ.

''ප්‍රධාන සංචිත මුදල් අධීක්ෂනය ශක්තිමත් කිරීම මත විශේෂ අවධාරනය යොදමින් ජාත්‍යන්තර මූල්‍ය පද්ධතිය'' හැසිරවීමෙ රෙගුලාසි පුලුල් කල යුතු බව වෙන් දැඩි ලෙස කියා සිටියේය. මූල්‍ය අර්බුදය ''සමහර ආර්ථිකයන්හි අවිධිමත් සාර්ව ආර්ථික ප්‍රතිපත්තීන් හා ඔවුන්ගේ තිරසාර කල නොහැකි සංවර්ධනයේ ආකෘතිය අංගලක්ෂිත කල, කාලයක් පැවති පහත් ඉතිරිකිරීම් හා ඉහල පාරිභෝජනය ද, අන්ධ ලෙස ලාභය හඹා ගිය මූල්‍ය ආයතනයන්හි අනවශ්‍ය පිම්බීම මත ද බැර කල යුතු බව '' ඔහු කියා සිටියේය. ''මූල්‍ය අධීක්ෂනයේ අසාර්ථකත්වය'' ද ඔහුගේ හෙලා දැකීමට ලක් විය.

පුටින් ඊටත් වඩා කෙලින් අදහස් දැක්වීය. ''එක් ධ්‍රැවයක ලෝකය'' පිලිබඳ සංකල්පයට පහර දුන් ඔහු ලෝකයේ ප්‍රධාන සංචිත මුදල ලෙස ඩොලරයේ වරප්‍රසාදිත තත්වය අවසන් කිරීම සඳහා කැඳවුම් කලේය. ''යන්තම් වසරකට පෙර මේ වේදිකාවේම හිඳ කථා කරමින් ඇමරිකානු නියෝජිතයින් අවධාරනය කලේ එක්සත් ජනපද ආර්ථිකයේ මූලික පදනම්වල ස්ථාවරත්වය හා සුපැහැදිලි අනාගත බලාපොරොත්තු පිලිබඳවය. අද දිනයේ වෝල් වීදියේ මහන්තත්වය කියාපෑ ආයෝජන බැංකු මුලුමනින්ම පාහේ අතුරුදහන්ව ඇත. යන්තම් වසරක් තුල එම බැංකු ලබා ඇති අලාභය, 25 වසරක් තුල ඒවා ඉපැයූ ලාභය ඉක්මවා ඇත.''

ප්‍රින්ස්ටන් අර්ථශාස්ත්‍රඥ හා ෆෙඩරල් මහ බැංකුවේ හිටපු උප සභාපති ඇලන් බ්ලින්ඩර් මෙසේ ප්‍රතිචාර දැක්වීය. ''කනගාටුවට කාරනය නම් ටික කාලයකට ඉහතදී මෙයට ඔච්චම් කිරීමේ හැකියාව අපට තිබුන නමුත් දැන් අප සැබවින්ම ලෝකය පහලට ඇද දැමා ඇති බවයි.''

ඔබාමා පරිපාලනය සංසදයට එකදු ඉහල නිලධාරියෙකු හෝ යැවීමට අසමත් වීම මඟින් තම පාර්ශවයෙන් සංඥා කලේ මොනම බැරෑරුම් ජාත්‍යන්තර සමබන්ධීකරනයක් හෝ මූල්‍ය පරිපාලනයක් කෙරෙහි ඇමරිකාව දක්වන මන්දෝත්සාහී ප්‍රතිචාරයයි. ජර්මන් චාන්සලර් ඇන්ජිලා මර්කෙල්, බ්‍රිතාන්‍ය අගමැති ගෝර්ඩන් බ්‍රවුන්, ජපන් අගමැති ටාරෝ අසෝ ද ඇතුලු ලොව පුරා රාජ්‍ය නායකයන් මෙහි පෙල ගැසී සිටිය ද, නිවේදනය කර තිබූ පරිදි ප්‍රධාන ආර්ථික උපදේශක ලෝරන්ස් සමර්ස්, භාන්ඩාගිර ලේකම් ටිමෝති ගේත්නර්, ජාතික ආරක්ෂක උපදේශක ජෙනරාල් ජේම්ස් ජෝන්ස් හා එක්සත් ජනපදයේ මධ්‍යම මෙහෙයුම් අධිපති ජෙනරාල් ඩේවිඩ් පෙට්රාවුස් යන ඉහල ඇමරිකානු නිලධාරීන් කිසිවෙකුත් සමුලුවට පැමින සිටියේ නැත.

එක්සත් ජනපදය නිල වශයෙන් රැස්වීම මුලුමනින්ම පාහේ වර්ජනය කිරීම සලකුනු කරන්නේ, සංසදයේ රාජ්‍යතාන්ත්‍රික සුසංවරයට යටින් කැකෑරෙමින් ඇති කටුක ආතතීන් හා බෙදීම් ය. ආරක්ෂනවාදය පිටුදකින බවට දිවුරන පොදු ප්‍රකාශන ද, එවන් ප්‍රතිපත්තීන්ගෙන් ලෝක ආර්ථිකය කෙරෙහි වන ව්‍යසනකාරී ප්‍රතිවිපාක පිලිබඳ අනතුරු ඇඟවීම් ද ඩේවෝස් වෙතින් නිකුත්වන අතර යථාර්තය නම් ආර්ථික ජාතිකවාදයේ වැඩී යාමයි. සංසදය ඇරඹීමට සතියකටත් අඩු කාලයකට පෙර,

එක්සත් ජනපද භාන්ඩාගාර ලේකම් ගේත්නර් එක්සත් ජනපදය සමග වෙලඳ ගනු දෙනුවලදී වාසි ලැබීම සඳහා චීනය තම මුදල ''සංචාලනය'' කරන බවට චෝදනා නගමින්, චීනයට එරෙහිව වෙලඳ සම්බාධක පැනවීමේ හැකියාව පිලිබඳව ප්‍රකෝපකාරී අනතුරු ඇඟවීමක් නිකුත් කලේය.

මෝර්ගන් ස්ටැන්ලි ආයතනයේ ආසියා නියෝජිත ස්ටීවන් රොක් ඩේවෝස්හි සිට ''ආර්ථික ජාතිකවාදයේ නැඟී එන රැල්ල'' ගැන සඳහන් කලේය. ඊනියා දියුනුවෙමින් පවතින රටවල නියෝජිතයෝ, ඔබාමාගේ ආර්ථික උත්තේජක වැඩපිලිවෙල හා බැංකු ඇපදීම් වල ප්‍රතිපල වශයෙන් ලෝක වෙලඳපොලවලින් සපයාගත හැකි නයෙන් විශාල පංගුවක් ගිල දමනු ඇතැයි චෝදනා කලහ.

''විශාල ආර්ථිකයන් තමන්ගේම ප්‍රයෝජනය සඳහා ප්‍රාග්ධන වෙලඳපොලවලට ඇතුලු වෙමින් සිටිති.'' යයි දකුනු අප්‍රිකානු මුදල් ඇමති ට්‍රෙවර් මැනුවෙල් පැවසිය. මෙක්සිකෝවේ මූල්‍ය දියවී යාම සිදුවූ 1994 වන විට එරට බලයේ සිටි හිටපු ජනාධිපති අරනස්ටෝ සෙඩිලෝ මෙසේ සඳහන් කලේය. ''මූල්‍ය ගැටලුවෙන් නිදහස්වීම සඳහා එක්සත් ජනපදය තමන්ට සැලැස්මක් ඇතැයි පෙන්වන යම් සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍යය. දැනටමත් සිදුවෙමින් තිබෙන ආකාරයට, ප්‍රග්ධන වෙලඳපොලවලින් අප ඉවතට තල්ලුකර නොදමන බව දැන ගැනීමට දියුනුවන රටවල් ලෙස අපට අවශ්‍යය.''

බ්‍රිතාන්‍ය මූල්‍ය සේවා අධිකාරියේ සභාපති ඒ. ටර්නර් සාමිවරයාගේ ඒ හා සමාන උත්සුකයන් සහිතව කල ප්‍රකාශයක් *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රයෙහි උපුටා දක්වා තිබුනි. වෙලඳමට වඩා නය පහසුකම් මත මාධ්‍යගතවූ ''නව වානිජ්‍යවාදයක අන්තරාය'' ගැන එහි සඳහන් විය.

29 වන දින මෙම ආතතින් එලිමහනට පැමිනියේ, ගාසා අර්බුදය මත පැවති සාකච්ඡා වටයක් අතර තුර ඊශ්‍රායල් ජනාධිපති ෂිමෝන් පෙරේස් සමඟ ඇතිවූ කෝපාවිෂ්ඨ වචන හුවමාරුවකින් පසුව තුර්කි අගමැති රිසෙප් ටෙයිප් එර්ඩොගාන් වේදිකාවෙන් පිටව යාමත් සමඟය. තුර්කි ආන්ඩුව ඊශ්‍රයලය සමඟ සමීප දේශපාලන හා මිලිටරි සබඳකම් පවත්වන අතර එර්ඩොගාන් පෙරේස් වෙත මෙසේ කීවේය. '' මනුෂ්‍ය ඝාතනයට පැමිනි කල්හි ඔබ මරන්නේ කෙසේදැයි හොඳින් දැන සිටියි.''

ඩේවෝස් සංසදය සලකුනු කරන්නේ, ලෝකය පසමිතුරු ජාතික රාජ්‍යයන් අතර බෙදී පැවතීමේ හා නිෂ්පාදන හා මූල්‍ය මාධ්‍යයන් පුද්ගලික අයිතියේ ධනේශ්වර ආකෘතිය තුල පැවතීමේ තතු තුල, ආර්ථික අර්බුදය විසඳීමෙහි ලා බුද්ධිමත්, සම්බන්ධීකරන ප්‍රතිපත්තියක් වර්ධනය කිරීම කල නොහැකි දෙයක් බවය. ධනවාදයේ ආරක්ෂකයෙකු ලෙස කථාකරමින් පුටින්, පසුගිය දශක තුන පුරා මූල්‍ය කතිපයාධිකාරයේ දැවැන්ත වාසනාව ගෙන ආ මූල්‍ය පරපුටුභාවය ''ඉක්මනින් හෝ පසුව බිඳ වැටීමට නියමිතව තිබුනු බලාපොරොත්තුවේ පිරමිඩයක්'' ලෙස හැඳින්වූ අතර එය බිඳ වැටීමේ වන්දිය ගෙවිය යුත්තේ කවුරුන් ද යන්න ඇඟවුම් කලේය. ''මෙය හරියටම, අනාගත පරම්පරාවන් විසින් ගෙවීමට නියමිතව අති නොඉපැයූ ධනය එනම් නයක් වැන්නකි.''

පවත්නා දේශපාලන හා ආර්ථික පද්ධතිය තුල තිබෙන්නාවූ එකම අනාගතය, දුප්පත් කමේ හා මර්ධනයේ වැඩීම ද අවසාන මහා අවපාතයේ දී සිදුවූ පරිද්දෙන් නොවැලැක්විය හැකි අකරයට ගෝලීය යුද්ධයේ භීෂනයට තුඩුදුන් ජාතික ප්‍රතිවිරෝධයන්ගේ වර්ධනයයි.

ඩේවෝස්හි හොල්මන් කලේ, පෞද්ගලික ලාභය නොව මානව අවශ්‍යතා තෘප්තිමත් කිරීමේ පදනම මත ධනවාදය අවසන් කර සමාජවාදී සමාජයක් ගොඩනැඟීමට සටන් වදින කම්කරු පන්තියේ ස්වාධීන ව්‍යාපාරයක් පැන නැඟීමේ අවතාරයයි. ලෝක ආර්ථිකය බිඳ විසිරයාම ඉමහත් හදිසි භාවයකින් මතු කරන්නේ ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත කම්කරු පන්තියේ ඒකාබද්ධ අරගලයක් වර්ධනය කිරීමේ අවශ්‍යතාවයයි.

**බැරී ග්‍රේ**

© www.wsws.org